# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

**ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි තෘතීය පරීක්ෂණය (බාහිර) - 2011/2012**
**2014 අප්‍රේල්/මැයි/ජූනි**

**සමාජීයවිද්‍යා පීඨය**

## ආර්ථික විද්‍යාව - ECON E3025

**ව්‍යවහාරික ආර්ථික විද්‍යාව**

**<u>ප්‍රශ්න හතරකට (04) පමණක් පිළිතුරු සපයන්න</u>**

**ප්‍රශ්න සංඛ්‍යාව : 07 යි** **කාලය : පැය 03 යි**

---

01. "කිසියම් රටක ආර්ථික වෘද්ධියකින් තොරව ආර්ථික සංවර්ධනයක් ගැන කථා කළ නොහැකිය." මෙම ප්‍රකාශය හා ඔබ එකඟ වන්නේද? ආර්ථික වෘද්ධිය හා සංවර්ධනය යන සංකල්ප අතර වෙනස හඳුන්වා දෙමින් ඔබේ පිළිතුර පැහැදිලි කරන්න.

02. (අ) ශ්‍රී ලංකාවේ ගෙවුම් ශේෂ ලේඛනය තුළ අඩංගු ප්‍රධාන ගිණුම් පැහැදිලි කරන්න.

    (ආ) ගෙවුම්ශේෂ හිඟය මූල්‍යකරණය කිරීමේ දී අනුගමනය කළ හැකි කෙටි කාලීන හා දිගුකාලීන ක්‍රියාමාර්ග විස්තර කරන්න.

03. "ශ්‍රී ලංකාව වැනි සංවර්ධනය වන රටවල් ආර්ථික සංවර්ධනය සඳහා විදේශීය ආධාර මත අවශ්‍යයෙන්ම බලාපොරොත්තු තැබිය යුතු වේ." මෙම ප්‍රකාශයට අනුව විදේශීය ආධාර අවශ්‍ය වන හේතු සාධක සහ විදේශීය ආධාර ලබා ගැනීමේ ප්‍රතිවිපාක පැහැදිලි කරන්න.

04. (අ) කිසියම් රටක අධ්‍යාපන ක්‍රමය හා ආර්ථික සංවර්ධනය අතර පවත්නා සම්බන්ධතාව පැහැදිලි කරන්න.

    (ආ) ශ්‍රී ලංකාවේ අධ්‍යාපන ක්‍රමය ආර්ථික සංවර්ධනයට උචිත වන ආකාරයට සැලසුම් කිරීමේ දී ඔබ ඉදිරිපත් කරන යෝජනාවන් මොනවාදැයි සාකච්ඡා කරන්න.

05. 1977 න් පසු ශ්‍රී ලංකාවේ ආර්ථික ව්‍යුහය තුළ සිදුවෙමින් පවත්නා වෙනස්කම් පැහැදිලි කර, ආර්ථික වෘද්ධිය සඳහා එමගින් ඇති කරන බලපෑම විග්‍රහ කරන්න.

06. (අ) ශ්‍රී ලංකාවේ ග්‍රාමීය ණයගැතිභාවයට තුඩු දී ඇති හේතු පැහැදිලි කරන්න.

    (ආ) ආයතනික අංශයට වඩා ආයතනික නොවන අංශයේ ණය ගැනීම් ජනප්‍රිය වීමට හේතු වී ඇති සාධක පැහැදිලි කරන්න.

07. කලාපීය සහයෝගිතාවයේ ආරම්භය හා විකාශනය හඳුන්වා දී කලාපීය සහයෝගිතාව දකුණු ආසියා සහයෝගිත්ව සංවිධානය (SAARC) පිහිටුවා ගැනීමේදී අපේක්ෂිත අරමුණු පැහැදිලි කරන්න.

************************